# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2064/49 - 2018 අප්‍රේල් මස 01 වැනි ඉරිදා - 2018.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2018 අප්‍රේල් මස 01 වැනි දින සිට මෙහි උපලේඛනයේ III වන තීරයේ සඳහන් කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2017 ඔක්තෝබර් මස 02 දිනැති අංක 2039/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් දක්වා ඇති නියමය 2018 අප්‍රේල් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 මාර්තු මස 29 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* | *III වැනි තීරය* |
|---|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | | |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* | *බලාත්මක කාල සීමාව* |
| 01. | 07.01 | 0701.90 | අනෙකුත් - අර්තාපල් | කි. ග්‍රෑමයට රු.30.00 | මාස 03 ක කාලසීමාවක් සඳහා |
| 02. | 10.06 | | සහල් | | |
| | | 1006.20 | දහයියා ඉවත් කළ (දුඹුරු සහල්) | කි. ග්‍රෑමයට රු. 0.25/- | දින 31 ක කාලසීමාවක් සඳහා |
| | | 1006.30 | පාහින ලද හෝ ඔප දමන ලද හෝ නොලද සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ සහල් | | |


1A - PG 3978 — 532 (2018/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

| I වැනි තීරය | | | | II වැනි තීරය | III වැනි තීරය |
|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | | |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | බලාත්මක කාල සීමාව |
| | | 1006.30.10 | රතු සහල් (කැකුළු) | කි. ග්‍රෑමයට රු. 0.25/- | දින 31 ක කාලසීමාවක් සඳහා |
| | | 1006.30.20 | නාඩු සහල් (රතු හෝ සුදු) | කි. ග්‍රෑමයට රු. 0.25/- | |
| | | 1006.30.30 | සම්බා සහල් (රතු හෝ සුදු) | කි. ග්‍රෑමයට රු. 0.25/- | |
| | | 1006.40 | කැඩුනු සහල් | කි. ග්‍රෑමයට රු. 0.25/- | |
| 03. | 04.03 | 0403.10 | යෝගට් | කි. ග්‍රෑමයට රු. 625 | මාස 06 ක කාල සීමාවක් සඳහා |
| | | 0403.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 625 | |
| 04. | 04.05 | 0405.10 | වෙඩරු | කි. ග්‍රෑමයට රු. 880 | |
| | | 0405.20 | කිරි වලින් නිපදවූ තැවරුම් | කි. ග්‍රෑමයට රු. 880 | |
| | | 0405.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 880 | |
| 05. | 07.03 | 0703.20 | සුදු ළූනු | කි. ග්‍රෑමයට රු. 40 | |
| 06. | 08.05 | 0805.10.10 | දොඩම් - අළුත් | කි. ග්‍රෑමයට රු. 65 | |
| 07. | 08.06 | 0806.10 | මිදි - අළුත් | කි. ග්‍රෑමයට රු. 130 | |
| 08. | 08.08 | 0808.10 | ඇපල් - අළුත් | කි. ග්‍රෑමයට රු. 45 | |
| 09. | 09.10 | 0910.99.10 | උළුහාල් ඇට | කි. ග්‍රෑමයට රු. 50 | |
| 10. | 11.02 | 1102.90.20 | කුරක්කන් පිටි | කි. ග්‍රෑමයට රු. 150 | |
| 11. | 12.02 | 1202.42 | රටකජු - පොතු හරින ලද | කි. ග්‍රෑමයට රු. 112 | |
| 12. | 12.07 | 1207.50 | අබ ඇට | කි. ග්‍රෑමයට රු. 62 | |
| 13. | 25.01 | 2501.00 | ජලීය ආකාරයේ හෝ එසේ නොවන ආකාරයෙන් වූ හෝ එකතු කරන ලද කැටි නොගැසී මේ කාරකයෝ නිදහසේ පාවීම සඳහා වන ද්‍රව්‍යයන් අඩංගු වන්නාවූ, ශුද්ධ සෝඩියම් ක්ලෝරයිඩ් හෝ ලුණු (මේස ලුණු සහ ස්වභාවික තත්ත්වය වෙනස් කළ ලුණු ඇතුළුව) මුහුදු ජලය | කි. ග්‍රෑමයට රු. 40.00 | |

04 - 711

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.